# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 6 දරන
# ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 පෙබරවාරි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1992 පෙබරවාරි මස 28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ: ශත 90 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 6 දරන ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 පෙබරවාරි මස 26 වන දින]

එල්. ඩී. ඕ.—58/90

**ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"රාජකීය ආසියාතික සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක්, ඒ සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති හා ව්‍යවස්ථා අනුව ඒ සමිතියේ පරමාර්ථ සහ ඒ සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ඉෂ්ට කිරීම සඳහා 1845 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ පවත්වාගෙන ගොස් ඇති හෙයින් ද : පූර්විකාව.

"ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය" යන නමින් දැන් කටයුතු කරන එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ එකී සමිතිය විසින් සාර්ථකව ඉෂ්ට කර ඇති හෙයින් ද :

එකී සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1992 අංක 6 දරන ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. මෙහි මින්මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ දැනට සිටින තාක් සාමාජිකයන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට සහ ඉන්පසු "ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත් වන්නේය. තවද එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය සංස්ථාගත කිරීම.

3. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ වර්තමාන සහ අතීත මිනිසුන්ගේ ඉතිහාසය, ආගම්, භාෂා, සාහිත්‍ය, කලා, විද්‍යා සහ සමාජ තත්වයන් සහ ඔවුන්ට අදාළ සංස්කෘති සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම හා එවැනි පරීක්ෂණ ප්‍රවර්ධනය කිරීම ;

(ආ) ආසියානු රටවල වර්තමාන සහ අතීත ආගම්, ඇදහිලි, භාෂා සාහිත්‍ය, කලා, සංගීතය සහ වෙනත් විවිධ නිර්මාපක ප්‍රදර්ශන යන මේවාට සම්බන්ධ වූ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම් සම්බන්ධයෙන් සංසන්දනාත්මක සහ ඇගැයීමේ අධ්‍යයන කිරීම සහ ඒවා ශ්‍රී ලංකාවේ සංස්කෘතිය කෙරෙහි කෙසේ බලපෑවේද යන්න විභාග කර බැලීම ;

(ඇ) පුස්තකාල පිහිටුවීම සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සේවා සැපයීම සහ පොත්, සඟරා, චරිතාපදාන, නිබන්ධන සහ වාර සංග්‍රහ මුද්‍රණය කිරීම, පළ කිරීම සහ විකිණීම ;

(ඈ) පාඨශාලා සහ අධ්‍යාපනික ආයතන පිහිටුවා පවත්වා ගෙන යාම සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සහ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සහ නංවාලීම ;

(ඉ) ආසියානු සංස්කෘති සඳහා ශ්‍රී ලංකාවේ සහ පිටරටවල පිහිටි සංවිධාන සමග සුහද සම්බන්ධතා ඇති කර ගැනීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ප්‍රදර්ශන, දේශන, වැඩ සටහන්, සම්මන්ත්‍රණ, සාකච්ඡා සභා, වැඩ මුළු, විවාද, අධ්‍යාපනික චාරිකා සහ වෙනත් ක්‍රියාකාර කම් පිළියෙළ කිරීම, සංවිධානය කිරීම, පිහිටුවීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(උ) සංස්ථාවේ පරමාර්ථවලට අදාළ මාතෘකා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේදී හෝ විදේශීය රටවලදී, විශේෂයෙන්ම, ආසියාතික රටවලදී පැවැත්වෙන සම්මන්ත්‍රණවලට නියෝජිතයන් යැවීම ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය සහ විදේශීය සංවිධාන සමග සම්බන්ධතා ඇති කර ගැනීමට පියවර ගැනීම සහ අධ්‍යාපනික හුවමාරු ප්‍රවර්ධනය කිරීම ;

(එ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම අරභයා වූ කාර්යවල යොදවා ඇති සංස්ථාවේ සාමාජිකයන්ට සහ සේවකයන්ට මුදලින් හෝ අන්‍යාකාරයකින් ශිෂ්‍යත්ව හෝ ප්‍රදාන පිරිනැමීමෙන් උපකාර කිරීම ;

(ඒ) සංස්ථාවේ කටයුතු සතුටුදායක ලෙස කරගෙන යෑම සඳහා අරමුදල් එකතු කිරීම සහ ඒ අරමුදල් කළමනාකරණය කිරීම ; සහ

(ඔ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ පාලක සභාව

4. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ සභාපති, ආදි සභාපතිවරුන්, උප සභාපතිවරුන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් ද සමිතිය විසින් තෝරා පත් කර ගනු ලබන වෙනත් සාමාජිකයන් දහහතර දෙනකුගෙන් ද සමන්විත පාලක සභාවක් විසින්, තත් කාලයේ බලපවත්වන සංස්ථාවේ රීති සහ ව්‍යවස්ථාවලට අනුකූලව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුර දැරූ සමිතියේ පාලක සභාව සංස්ථාවේ ප්‍රථම පාලක සභාව විය යුතු ය.

සාමාජික ලේඛනය.

5. (1) සංස්ථාවේ පාලක සභාව විසින්, ලේඛනයක් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු අතර මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී සමිතියේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකුගේ සහ ආයතනයක ම නම එම ලේඛනයේ ඇතුළත් කරවිය යුතු ය. තව ද ඊට පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් නිසි ලෙස බඳවා ගනු ලබන සෑම තැනැත්තකු හෝ ආයතනයක් විසින් ම ස්වකීය නාමය එම ලේඛනයට ඇතුළත් කරවා ගත යුතු ය.

(2) ලේඛනයේ, පහත දැක්වෙන විස්තර අඩංගු විය යුතු ය :—

(අ) එක් එක් සාමාජිකයාගේ නම සහ ලිපිනය ;

(ආ) සාමාජිකයාගේ (උපාධි ඇතුළුව) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් ;

(ඇ) සාමාජිකයකු වශයෙන් යම් තැනැත්තකුගේ හෝ ආයතනයක නම ලේඛනයේ සටහන් කළ දිනය ; සහ

(ඈ) යම් තැනැත්තකු හෝ ආයතනයක්, සාමාජිකයකු වීම නතර වූ දිනය.

සමිතියේ රීති.

6. (1) සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ වාර්ෂික හෝ විශේෂ මහ සභා රැස්වීමක දී, එහි පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙපංගුවකට නොඅඩු ඡන්දයෙන් සංස්ථාවේ සාමාජිකත්වයට සාමාජිකයන් ඇතුළත් කරගැනීම සහ ඔවුන් සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් සංස්ථාවේ නිලධාරීන් තෝරා පත් කර ගැනීමේ ක්‍රමය සම්බන්ධයෙන්, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස් වීම, විශ්‍රාම ගැනීම හෝ පහ කිරීම සම්බන්ධයෙන්, සංස්ථාවේ පාලක සභාවේ කාර්ය සහ සංස්ථාවේ නිලධරයන්, භාරකරුවන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීමේ පිළිවෙළ සම්බන්ධයෙන්, එහි කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සම්බන්ධයෙන්, මේ පනතේ විධිවිධානවලට හා වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) 1985 මාර්තු මස 30 වන දින දරන ව්‍යවස්ථාවේ අඩංගු රීති මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ ලෙස සැලකිය යුතු අතර ඒවා (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, සියලු කාර්ය සඳහා, තත් කාලයේ සංස්ථාවේ ව්‍යවස්ථා (රීති) ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) ව්‍යවස්ථාවේ ඇති රීති හෝ ඉන් යම් රීතියක් හෝ සංස්ථාව විසින් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද වෙනත් යම් රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ ඒවා පරිච්ඡින්න කිරීම, යම් වාර්ෂික හෝ විශේෂ මහා සභා රැස්වීමකදී, එහි

පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙපංගුවක බහුතර ඡන්දයෙන් කළ හැකි ය. එසේ වුව ද ඒ පිළිබඳ නිසි දැන්වීමක් සාමාජිකයන්ට දී තිබිය යුතු ය.

(4) සංස්ථාවේ සෑම සාමාජිකයකු ම තත්කාලයේ බලපවත්වන සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ ගිණුම්.

7. සංස්ථාවේ සියලු ආදායම් සහ වියදම් පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට සංස්ථාවේ පාලක සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය. සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණක වරුන් විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

8. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී පැවති සමිතියේ සියලු ණය හා බැරකම්, මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට සමිතියට අයවිය යුතුව ඇති සියලු ණය සහ ගෙවිය යුතුව ඇති දායක මුදල් හා ආධාර මුදල්, මේ පනතේ කාර්ය සඳහා, මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවට, ගෙවනු ලැබිය යුතු ය.

(2) සමිතිය විසින් එළඹෙන ලදුව, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි පවතින සියලු ගිවිසුම් සංස්ථාවේ ගිවිසුම් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

මුදල් සහ දේපළ යෙදවීම.

9. සංස්ථාවේ මුදල් සහ දේපළ හුදෙක් ම මෙහි දක්වා ඇති පරිදි වූ සංස්ථාවේ පරමාර්ථ නංවාලීම සඳහාම යොදා ගත යුතු අතර ඉන් කිසිම කොටසක් සංස්ථාවේ යම් සාමාජිකයකුට ලාභාංශ, ප්‍රසාද මුදල් හෝ ලාභ වශයෙන් හෝ වෙනත් ආකාරයකින්, කෙළින් ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය

එසේ වුව ද—

(අ) සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන් සංස්ථාවේ යම් නිලධරයකුට හෝ සේවානියුක්තයකුට හෝ සමිතියේ යම් සාමාජිකයකුට සද්භාවයෙන් යම් සාධාරණ සහ නිසි පාරිශ්‍රමික ගෙවීම ;

(ආ) සංස්ථාවට කුලියට දෙන ලද ස්ථාන සඳහා සාධාරණ සහ නිසි කුලී ගෙවීම ; සහ

(ඇ) තම කර්තව්‍ය හෝ කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමෙහිලා සංස්ථාවේ යම් සාමාජිකයකු, භාරකරුවකු, නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින්, පාලක සභාවෙන් කලින් ලබාගත් අනුමතය ඇතිව දරන ලද සාධාරණ හා නිසි වියදම් ප්‍රතිපූර්ණය කිරීම හෝ ආපසු ඔහුට ගෙවීම

මේ වගන්තියේ විධිවිධාන මගින් නොවැළැක්වේ.

**10.** (1) යම් මිලට ගැනීමේ, ප්‍රදානය කිරීමේ හෝ බද්දට ගැනීමේ සාධන පත්‍රයක් ප්‍රකාරව හෝ යම් තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාරව හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු කරනු ලැබූ යම් චංචල හෝ නිශ්චල දේපළක්, අර්ථලාභී අයිතිකරු වශයෙන් හෝ භාරකරු වශයෙන් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව විසින් අත්කර ගැනීම සහ දැරීම නීත්‍යානුකූල වන්නේ ය.

දේපළ දැරීමට සංස්ථාවට ඇති බලය.

(2) කලින් කල, එවැනි යම් දේපළක් උකස් කිරීමට, විකිණීමට, ප්‍රදානය කිරීමට, පවරාදීමට, රික්ථවරණය කිරීමට, පාවාදීමට, හුවමාරු කිරීමට හෝ වෙනත් ක්‍රමයකින් බැහැර කිරීමට ද සමිතියේ පරමාර්ථ ඉටු කිරීම සඳහා පාලක සභාව විසින් විධානය කරනු ලබන පරිදි අවශ්‍ය හෝ සුදුසු ආකාරයකට සමිතියේ අරමුදල් ආයෝජනය කිරීමට ද සමිතියට බලය තිබිය යුතු ය.

**11.** පහත සඳහන් දේ සංස්ථාව විසින් කිරීම නීත්‍යානුකූල වන්නේය :—

සංස්ථාවේ බලතල.

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වූ ද ඒ කාර්ය සඳහා නීත්‍යානුකූලව අත්කර ගත හැකි වූ ද ඉඩම් සහ ගොඩනැගිලි මිලට ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම හා වෙනත් ආකාරවලින් ලබා ගැනීම සහ සංස්ථාවේ පරමාර්ථ නංවාලීම සඳහා පදුසු යැයි සැලකෙන ආකාරයට ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ ඒවා බැහැර කිරීම ;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් පාලක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන ආකාරයකට ආයෝජනය කිරීම සහ එවැනි යම් ආයෝජන කලින් කල වෙනස් කිරීම හෝ මාරු කිරීම ;

(ඇ) සංස්ථාවේ පාලක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන ආකාරයකට, යම් ඇප මත මුදල් ණයට ගැනීම හෝ සොයා ගැනීම හෝ සංස්ථාවේ යම් ණයක් හෝ බැඳීමක් සම්බන්ධයෙන් ඇපවීම හෝ එම ණය හෝ බැඳීම ගෙවා නිදහස් කිරීම ;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා සියලු අත්දමේ දායක මුදල්, ප්‍රදාන, ත්‍යාග, පරිත්‍යාග ඉල්ලා සිටීම හා උපයා ගැනීම සහ ලබාගැනීම ;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම, නඩත්තු කිරීම හෝ වෙනස් කිරීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථවලට අදාළ විෂයයන් පිළිබඳව පොත් පත්, සඟරා, පත්‍රිකා, අත් පිටපත් සහ ලේඛන සහිත පුස්තකාලයක් පිහිටුවීම සංවිධානය කිරීම සහ පවත්වාගෙන යාම සහ ආශ්‍රේය කාර්යය සඳහා විශේෂයෙන් වෙන් කර නැති පොත් පත් සඟරා, පත්‍රිකා, අත් පිටපත් සහ ලේඛන සාමාජිකයන්ට පරිශීලනය සඳහා බැහැර දීම සඳහා රීති සහ ව්‍යවස්ථා සම්පාදනය කිරීම ;

(ඏ) නිශ්චිත කාර්ය සඳහා විවිධ අරමුදල් පිහිටුවා පවත්වාගෙන යාම සහ එම අරමුදල්වල ඇති මුදල්, සංස්ථාවේ පරමාර්ථ වල විෂයපථයට ඇතුළත් වන පර්යේෂණ ව්‍යාපෘතිවල යෙදෙන සාමාජිකයන්ට ගෙවීම සඳහා රීති සම්පාදනය කිරීම ;

(ඐ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත්කිරීම, සේව යෙන් පහ කිරීම හෝ ඔවුන්ගේ සේවය නතර කිරීම සහ මුදල් පාලක සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන වැටුප්, දීමනා, ප්‍රසාද මුදල් හා පාරිතෝෂික ඔවුන්ට ගෙවීම ;

(එ) සංස්ථාවේ වර්තමාන සහ ආදි නිලධරයන්ට හා සේවක යන්ට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට පාරිතෝෂික, විශ්‍රාම වැටුප්, දීමනා සහ වෙනත් ප්‍රතිලාභ ප්‍රදානය කිරීම සඳහා යම් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවීම හෝ එවැන්නකට දායක මුදල් ගෙවීම ;

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නංවාලීම සඳහා, සංස්ථාගත හෝ නොඑසේ වූ යම් තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල සමඟ හෝ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් පාලන ආයතනයක් සමඟ යම් ගිවිසුමකට එළඹීම ; සහ

(ඓ) සංස්ථාවේ පරමාර්ථ නිසි හා සාර්ථක ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියළු දේ කිරීම.

සංස්ථාවේ මුද්‍රාව.

**12.** සංස්ථාවේ මුද්‍රාව, පාලක සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ දී හැර, කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තව ද ඒ සාමාජිකයන් දෙදෙනා ඒ අවස්ථාවේ දී පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම තම අත්සන් කළ යුතු අතර ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සනට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**13.** සංස්ථාවේ සාමාජිකයකුගෙන් සාමාජික මුදල් වශයෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල ඉක්මවන කිසිම සම්මාදම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් කාර්යයන් සඳහා හෝ ගෙවීමට කිසිදු සාමාජිකයෙකු බැඳී නැත.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

**14.** සංස්ථාව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව එහි සියලුම ණය සහ බැරකම් ගෙවා බේරුම් කිරීමෙන් පසු, කවර වූ හෝ දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ දේපළක් තම සාමාජිකයන් අතර බෙදාදීම ස්වකීය රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කළ යුතු ය. ඒ ආයතනය හෝ ආයතන කවරේද යන වග, සංස්ථාව විසුරුවා හරින වේලාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින්, තීරණය කළ යුතු ය. ඒ දේපළ හෝ ඉන් යම් කොටසක් මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව බැහැර කළ

නොහැකි වේනම්, ඒ දේපළ හෝ ඉන් කොටසක් සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලබන යම් පුණ්‍යමය කාර්යයන් සඳහා යෙදවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

16. මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාලයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.